(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 5(4).]

# පාර්ලිමේන්තුවේ අංක 5 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2017 ජනවාරි මස 20 වැනි සිකුරාදා**

## 2017 පෙබරවාරි මස 21 වැනි අඟහරුවාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

528/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 වනවිට ශ්‍රී ලංකාවේ ගම්මිරිස් වගා කරනු ලැබූ භූමි ප්‍රමාණය කොපමණද;

(ii) 2010 සිට 2015 දක්වා වසර පහ තුළ ගම්මිරිස් නිෂ්පාදනය, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කිලෝග්‍රෑම් කොපමණද;

(iii) රජය විසින් ගොවීන්ගෙන් සෘජුවම ගම්මිරිස් මිලදී ගන්නේද;

(iv) එසේ නම්, පසුගිය වසර පහ තුළ රජය විසින් මිලදී ගත් ගම්මිරිස් ප්‍රමාණය, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගම්මිරිස් නිෂ්පාදනය ඉහළ දැමීමට රජය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

920/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 සිට 2015 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් පැරණි යකඩ අලෙවි කිරීම සඳහා කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iii) 2011 සිට 2015 දක්වා එක් එක් වර්ෂයේදී අලෙවි කළ යකඩ ප්‍රමාණයන් හා මිල ගණන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම යකඩ මිලදී ගත් පුද්ගලයන් සහ එක් එක් පුද්ගලයා විසින් මිලදී ගන්නා ලද යකඩ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) වෙළඳපොළේ පැවති මිල ගණන්වලට වඩා අඩුවෙන් විකිණීම නිසා ශ්‍රී ලංකා වරාය අධිකාරියට සිදුවූ අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

961/'16

ගරු බිමල් රත්නායක මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ විශ්වවිද්‍යාලයේ දැනට ක්‍රියාත්මක පීඨ සංඛ්‍යාව කොපමණද;

(ii) එහි ක්‍රියාත්මක දෙපාර්තමේන්තු සංඛ්‍යාව කොපමණද;

(iii) එක් එක් පීඨවල හා දෙපාර්තමේන්තුවල සිටිය යුතු ස්ථිර ආචාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ස්ථිර ආචාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තිබේද;

(v) එසේ නම්, පුරප්පාඩු සංඛ්‍යාව, එක් එක් පීඨය සහ දෙපාර්තමේන්තුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1001/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ගොවිජන බැංකුව නමින් බැංකුවක් ක්‍රියාත්මක වන බවත්;

(ii) එම බැංකුව 1988 අංක 30 දරන බැංකු පනත හෝ 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ ලියාපදිංචි කර නොමැති බවත්;

(iii) ලියාපදිංචි නොකර ජනතාවගෙන් තැන්පතු භාර ගැනීම නීති විරෝධී බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ගොවිජන බැංකුව ලියාපදිංචි නොකිරීමට හේතු කවරේද;

(ii) එම බැංකුව ලියාපදිංචි කිරීමට හෝ අහෝසි කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1036/'16

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගම්පහ දිස්ත්‍රික්කය අයත් වන්නේද;

(ii) එසේ නම්, එම දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් අමාත්‍යාංශය විසින් වෙන් කර ඇති මුදල කොපමණද;

(iii) ගම්පහ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2016 වර්ෂයේ අයවැයෙන් "මහ කොළඹ නාගරික ප්‍රවාහන හා සංවර්ධන ව්‍යාපෘතිය" සඳහා වෙන් කරන ලද රුපියල් මිලියන 714ක මුදලින් ආරම්භ කර ඇති පිටත වටරවුම් හා දක්ෂිණ අධිවේගී මාර්ග ප්‍රවේශ පුළුල් කිරීමේ ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත (i) හි සඳහන් ව්‍යාපෘති කවරේද;

(iii) සංවර්ධනය කර ඇති දුම්රිය මාර්ග හා බස් පර්යන්ත සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත (ii) හි සඳහන් ව්‍යාපෘති හේතුවෙන් මහජනතාවගේ ගමන් කාලය පැවති ප්‍රමාණයට වඩා කොපමණ ප්‍රමාණයකින් අඩු වී තිබේද;

(v) ඉහත (i)හි සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක වී නොමැති නම්, ඒ සඳහා වෙන් කරන ලද මුදලට සිදුවූයේ කවරක්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1061/'16

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු සහ නැගෙනහිර පළාත්වල පසුගිය කාලයේ පැවැති යුද්ධය හේතුවෙන් ආබාධිත තත්ත්වයට පත් වූ බොහෝ දෙනෙකු සිටින බවත්;

(ii) මෙම පුද්ගලයන්ගෙන් සැලකිය යුතු පිරිසකගේ කශේරුකාවට සිදුවී ඇති හානිය හේතුවෙන් ඉනෙන් පහළ කොටස අප්‍රාණික වී ඇති බවත්;

(iii) අවතැන් වූ මෙම පිරිසගෙන් බොහෝ දෙනෙකු මේ වනවිට නැවත පදිංචි කර ඇති අතර තවත් පිරිසක් තවමත් නැවත පදිංචි කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උතුරු සහ නැගෙනහිර පළාත්වල නැවත පදිංචි කරන ලද ජනතාවට රජයෙන් සහ රාජ්‍ය නොවන සංවිධානවලින් නිවාස සහ වැසිකිළි ඉදිකර දීමේදී ඉහත කී ආබාධිත පුද්ගලයන්ගේ නිවාසවලට ප්‍රවේශවීමේ හා වැසිකිළි භාවිතා කිරීමේ පහසුකම් කෙරෙහිද අවධානය යොමුකරමින් ඒ සඳහා සුදුසු අයුරින් ඉදිකළ නිවාස හා වැසිකිළි ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ ප්‍රතිශතයකින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1096/'16

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ පාසල්වල පැවති අ. පො. ස. (උසස් පෙළ) විභාගය සඳහා එම දිස්ත්‍රික්කයෙන් පරිබාහිර වෙනත් දිස්ත්‍රික්කවලට අයත් සිසුන් පෙනී සිටීමේ සිද්ධීන් ගණනක් වාර්තා වූ බව දන්නේද;

(ii) එම තත්ත්වය නිසා අඩු පහසුකම් යටතේ අ. පො. ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිට විශ්වවිද්‍යාල ප්‍රවේශය අපේක්ෂා කරන පුත්තලම දිස්ත්‍රික්කයේ සිසුන්ට බලවත් අසාධාරණයක් සිදු වූ බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පිටස්තර දිස්ත්‍රික්කවල සිසුන්ගේ ව්‍යාපෘති වාර්තා ව්‍යාජ ලෙස අනුමත කර පුත්තලම දිස්ත්‍රික්කයෙන් ඉහත විභාගවලට පෙනී සිටීමට අනුබල දුන් විදුහල්පතිවරුන්ගේ නම් හා ඔවුන් සේවය කරන පාසල් කවරේද;

(ii) එවැනි නීති විරෝධී කටයුතු කළ හා එම නීති විරෝධී කටයුතු සඳහා අනුබල දී ඇති විදුහල්පතිවරුන්ට හා අධ්‍යාපන බලධාරින්ට එරෙහිව යම් විනය ක්‍රියාමාර්ගයක් ගැනීමට අපේක්ෂා කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1105/'16

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උතුරු පළාත් සභා බලප්‍රදේශය තුළ පිහිටි මන්නාරම, මුලතිව්, කිලිනොච්චි හා යාපනය යන දිස්ත්‍රික්කවලට අයත් මඩු, ඔට්ටුසුඩාන්, කණ්ඩාවලෛ සහ මරුදන්කෙනි යන ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශවලට අදාළව, ප්‍රාදේශීය සභා ස්ථාපිත කර නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) යෝජිත පළාත් පාලන ආයතන කොට්ඨාස ක්‍රමයට පිහිටුවීමට අදාළව සීමා නිර්ණ කමිටුව විසින් ඉහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අදාළව නව ප්‍රාදේශීය සභා ස්ථාපිත කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1124/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වත්මන් යහපාලන ආණ්ඩුව බලයට පත්වීමෙන් පසු ඌව පළාත තුළ පුද්ගලික බස්රථ සඳහා මාර්ග බලපත්‍ර ලබා දී තිබේද;

(ii) එසේ නම්, එලෙස මාර්ග බලපත්‍ර ලබාදී ඇති මාර්ග කවරේද;

(iii) එසේ මාර්ග බලපත්‍ර ලබාගත් පුද්ගලයන්ගේ නම් කවරේද;

(iv) ඒ සඳහා අනුගමනය කළ ක්‍රමවේද කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1129/'16

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016.09.22 දින බස්නාහිර පළාත් පාලන කොමසාරිස්වරයා විසින් කොටිකාවත්ත, මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ ලේකම්වරිය මූලික විමර්ශනයකින් තොරව සහ කිසිදු සාධාරණ හේතුවකින් තොරව ස්ථාන මාරු කළ බවත්;

(ii) මූලික විමර්ශනයකින් තොරව මාරු කිරීම් සිදු නොකරන ලෙසත්, එම මාරු කිරීම අවලංගු කරන ලෙසත් බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයා විසින් එදිනම දන්වා ඇති බවත්;

(iii) බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයා විසින් එසේ දන්වා තිබියදී, බස්නාහිර පළාත් සභාවේ ලේකම්වරයා හෝ පළාත් පාලන කොමසාරිස්වරයා එම දැනුම්දීම ක්‍රියාත්මක කිරීම පැහැර හැර ඇති බවත්;

(iv) කරුණු එසේ තිබියදී, ඉන් දින කිහිපයකට පසු පළාත් පාලන කොමසාරිස්වරයා ප්‍රාදේශීය සභා ලේකම්වරියට බලපෑම් කොට ස්වකැමැත්තෙන් ස්ථාන මාරුවන බවට කැමැත්ත ලබා ගත් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පළාත් පාලන ආයතනයක කාලය අවසන්ව තිබෙන තත්ත්වයක් යටතේ එම පළාත් පාලන ආයතනයේ ලේකම්වරයාව මූලික විමර්ශනයකින් තොරව ස්ථාන මාරු කිරීමක් කළ හැකිද;

(ii) ඉහත අ (iii) සඳහන් පැහැර හැරීම සිදු කර නොමැති නම්, ඒ බව ඔප්පු කළ හැකිද;

(iii) මෙම සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1141/'16

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, ඒරාවූර්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවන ලද දිනය කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද ගැසට් පත්‍රයේ පිටපතක් සභාගත කරන්නේද;

(iii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මඟින් ආවරණය වන සම්පූර්ණ භූමි ප්‍රමාණය කොපමණද;

(iv) එහි ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව කොපමණද;

(v) එම ග්‍රාම නිලධාරී වසම්වල නිල අංක හා නාමයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවීමේදී නිල වශයෙන් සීමා නිර්ණය කිරීමක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එකී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ඇති ග්‍රාම නිලධාරී වසම් අතරින් කිසියම් වසමක/වසම්වල පරිපාලන කටයුතු හෝ මෙහෙයවීම් වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදුකරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ග්‍රාම නිලධාරී වසම්වල නාමය, නිල අංක ඇතුළු විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1165/'16

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතා විමුක්ති පෙරමුණේ හිටපු නායකයෙකු වූ රෝහණ විජේවීර මහතාට අයත්ව තිබී, පසුව රජයට පවරා ගත් උලපනේ පිහිටි නිවසේ ජාතික තරුණ සේවා සභාව මඟින් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන බවත්;

(ii) මෙම ආයතනයේ දැනට සිසුන් 500ක පමණ සංඛ්‍යාවක් ඉගෙන ගන්නා බවත්;

(iii) එය දියුණු තත්ත්වයක පවතින බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මෙම ආයතනය ආරම්භ කළ දින සිට මේ දක්වා සිසුන් 5000කට වැඩි සංඛ්‍යාවක් වෘත්තීය පුහුණුව ලබා පිටව ගොස් ඇති බවත්;

(ii) එසේ තිබියදී මෙම ආයතනය උලපනේ ප්‍රදේශයෙන් ඉවත් කර වෙනත් ප්‍රදේශයකට රැගෙන යාමට ජාතික තරුණ සේවා සභාව කටයුතු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) උලපනේ ප්‍රදේශයේ දියුණු තත්ත්වයකින් පවත්වාගෙන යනු ලබන මෙම ආයතනය වෙනත් ප්‍රදේශයකට ගෙන යාමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1206/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) L.T.T.E. ත්‍රස්තවාදීන් විසින් 1983 වර්ෂයෙන් පසුව මඩකලපුව දිස්ත්‍රික්කය තුළ ඝාතනය කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් ජන වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එලෙස ඝාතනයට ලක් වූ,

(i) එක් එක් දේශපාලන පක්ෂයන්හි නායකයන් හෝ සාමාජිකයන් සංඛ්‍යාව;

(ii) එක් එක් ආගම්වලට අයත් ආගමික නායකයන් හෝ ආගමික ජන කොටස් සංඛ්‍යාව;

(iii) රාජ්‍ය නිලධාරින් සංඛ්‍යාව;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත (අ) සහ (ආ) විමසා ඇති කරුණු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1277/'16

ගරු කංචන විජේසේකර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලාංකීය ජාතික ආර්ථිකය මෙන්ම, ලක් ජනතාවද එකසේ පෝෂණය කිරීම සඳහා කැපවී සිටින ලාංකීය ධීවර ප්‍රජාව, තම කර්මාන්තය පවත්වාගෙන යනු ලබන්නේ ඉමහත් වූ බාධාවන් මධ්‍යයේ බවත්;

(ii) ඔවුන් අත්විඳිනා අනේකවිධ පීඩාවන්ට අමතරව, සාගර සම්පත් කොල්ලකනු ලබන විදේශිකයන්ගේ අඩත්තේට්ටම්වලට මුහුණ පෑමට ද සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ජාත්‍යන්තර සාගර සීමාව උල්ලංඝනය කිරීම හේතුවෙන් විදේශ රාජ්‍යයන්හි දී අත්අඩංගුවට පත් වූ ශ්‍රී ලාංකීය ධීවරයන් හා යාත්‍රා සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) දැනට අත්අඩංගුවේ පසු වන ශ්‍රී ලාංකීය ධීවරයන් සංඛ්‍යාව, අත්අඩංගුවේ පසුවන රාජ්‍යය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලාංකීය සමුද්‍ර සීමාවන් උල්ලංඝනය කිරීම හේතුවෙන් මෙරට අත්අඩංගුවෙහි පසුවන විදේශික ධීවරයන් සංඛ්‍යාව, ඔවුන් අයත් රට අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) විදේශ රාජ්‍යයන්හි අත්අඩංගුවේ පසුවන ශ්‍රී ලාංකීය ධීවරයන් මුදා ගැනීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1278/'16

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.10.01 දිනට අධ්‍යාපන සේවා නියුක්තයන්ගේ සමූපකාර සකසුරුවම් හා ණය දෙන සමිතිය සතුව පවතින සම්පූර්ණ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) 2016.06.11 වනවිට එම සමිතිය සතුව තිබූ ස්ථිර තැන්පතු ප්‍රමාණය කොපමණද;

(iii) මේ වනවිට ඉහත කී සමිතියෙන් ණය අයදුම්කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ණය අයදුම්කරුවන් අතරින්, ණය අනුමත වූ නමුත්, මෙතෙක් ණය මුදල් මුදා හැර නොමැති සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(v) එම ණය අයදුම්කරුවන්ට ගෙවිය යුතුව ඇති ණය මුදල්වල එකතුව කොපමණද;

(vi) එකී ණය අයදුම්කරුවන් වෙත ණය මුදල් මුදා හැරීම ප්‍රමාද වීමට හේතුව කවරේද;

(vii) ඉහත කී සමිතිය තම සාමාජිකයන් වෙත නිසි ලෙස ණය මුදල් මුදා හැරීමට නොහැකි තත්ත්වයකට පත්වී ඇති බව දන්නේද;

(viii) එසේ නම්, එම සමිතියේ මූල්‍ය පාලනය විධිමත් කිරීම සඳහා ඉදිරියේ දී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 පෙබරවාරි මස 22 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

534/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 වනවිට ශ්‍රී ලංකාවේ කව්පි වගා කරනු ලැබූ භූමි ප්‍රමාණය කොපමණද;

(ii) 2010 සිට 2015 දක්වා වසර පහ තුළ කව්පි නිෂ්පාදනය, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කිලෝග්‍රෑම් කොපමණද;

(iii) රජය විසින් ගොවීන්ගෙන් සෘජුවම කව්පි මිලදී ගන්නේද;

(iv) එසේ නම්, පසුගිය වසර පහ තුළ රජය විසින් මිලදී ගත් කව්පි ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කව්පි නිෂ්පාදනය ඉහළ නැංවීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවට කව්පි ආනයනය කරන්නේද;

(ii) එසේ නම්, පසුගිය වසර පහ තුළ ආනයනය කළ කව්පි ප්‍රමාණය, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකාව කව්පි අපනයනය කරන්නේද;

(iv) එසේ නම්, පසුගිය වසර පහ තුළ අපනයනය කළ කව්පි ප්‍රමාණය, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

921/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 ජනවාරි සිට 2015 ජනවාරි දක්වා කාලය තුළ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ සිදුවී ඇති වංචා, දූෂණ සහ රාජ්‍ය දේපළ අවභාවිතය සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමෙන් පරීක්ෂණ පවත්වනු ලබන්නේද;

(ii) එසේ නම්, එම එක් එක් පරීක්ෂණයේ ප්‍රගතිය කවරේද;

(iii) එම වංචා හා දූෂණ සම්බන්ධයෙන් අමාත්‍යාංශ නිලධාරීන් සම්බන්ධ බවට හඳුනාගෙන තිබේද;

(iv) එසේ නම්, ඔවුන් සම්බන්ධයෙන් ගනු ලැබූ විනය ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

962/'16

ගරු බිමල් රත්නායක මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජරට විශ්වවිද්‍යාලයේ දැනට ක්‍රියාත්මක පීඨ සංඛ්‍යාව කොපමණද;

(ii) එහි ක්‍රියාත්මක දෙපාර්තමේන්තු සංඛ්‍යාව කොපමණද;

(iii) එක් එක් පීඨවල හා දෙපාර්තමේන්තුවල සිටිය යුතු ස්ථිර ආචාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ස්ථිර ආචාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තිබේද;

(v) එසේ නම්, පුරප්පාඩු සංඛ්‍යාව, එක් එක් පීඨය සහ දෙපාර්තමේන්තුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

991/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රාදේශීය සංවර්ධන කමිටු සභාපතිවරයන් හෝ සම සභාපතිවරයන් ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් නොවන පුද්ගලයන් පත් කර තිබේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම් සහ ඔවුන් සභාපතිත්වය දරන ප්‍රාදේශීය සංවර්ධන කමිටු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම සභාපතිවරයන් සතු බලතල කවරේද;

(iv) එම පුද්ගලයන් එකී තනතුරුවලට පත් කිරීමේ පදනම කවරේද;

(v) එම පුද්ගලයන්ගේ ඉහළම අධ්‍යාපන හෝ වෘත්තීය සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) ඒකී සභාපතිවරයන්ට/සම සභාපතිවරයන්ට ලබා දෙන වැටුප්, දීමනා සහ වෙනත් පහසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1037/'16

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— විදේශ රැකියා අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) සංක්‍රමණික සම්පත් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සඳහා 2016 අයවැයෙන් අමාත්‍යාංශයට වෙන් කරන ලද රුපියල් මිලියන 400 ක මුදලින් මේ වනවිට ඉදිකර ඇති මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථාන ඉදිකර ඇති දිස්ත්‍රික්ක සහ ස්ථාන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම මධ්‍යස්ථානවලට ලබාදී ඇති සම්පත් කවරේද;

(iv) එම මධ්‍යස්ථානවල ආරම්භ කර ඇති පුහුණු වැඩසටහන් සංඛ්‍යාව කොපමණද;

(v) ඒවායින් සේවය සපයා ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය හේතුවෙන් විදේශ රැකියා සඳහා යොමුවන පුද්ගලයන්ගේ ගුණාත්මකභාවය වැඩි වූ ආකාරය කවරේද;

(ii) මෙම ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත ඉලක්ක සපුරා තිබේද;

(iii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1062/'16

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරේ යුද්ධය හේතුවෙන් පීඩාවට පත් මාධ්‍යවේදීන් සිටින බවත්;

(ii) ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් ඔවුන්ට රුපියල් ලක්ෂ 10ක් වටිනා නිවාස ලබාදෙන බවට දැනුම්දී ඇති බවත්;

(iii) ඒ අනුව, උතුරේ මාධ්‍යවේදීන් තිදෙනෙක් තෝරාගෙන ඔවුන්ට නිවාස ලබා දීමේ වගකීම මාධ්‍ය ආයතන තුනක් විසින් භාරගෙන ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත වැඩසටහනේ වත්මන් තත්ත්වය කවරේද;

(ii) මීට අමතරව යුද්ධය නිසා පීඩාවට පත් මාධ්‍යවේදීන්ට නිවාස ලබා දිය හැකි වෙනත් සැලසුම් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1097/'16

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පුත්තලම දිස්ත්‍රික්කය තුළ පිහිටි;

(i) ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් ජාතික පාසලේ නම කවරේද;

(iii) එක් එක් ජාතික පාසලේ ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එක් එක් ජාතික පාසලේ සේවය කරන ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම පාසල් අතරින් තාක්ෂණික විද්‍යාගාර සහ භාෂා විද්‍යාගාර ආදී පහසුකම් ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම පාසල්වල ගුරු පුරප්පාඩු පවතීද;

(vii) එසේ නම්, ඒ කවර විෂයයන් සඳහාද;

(viii) එම ගුරු පුරප්පාඩු පිරවීමට ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1106/'16

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලයේ මන්නාරම කාර්යාලයේ පැවති තනතුරු පුරප්පාඩු සඳහා තාවකාලික සහ අනියම් පදනම මත සේවකයන් 09 දෙනෙකු බඳවාගෙන ඇති බවත්;

(ii) එම පුද්ගලයන් අවුරුදු 06කට වඩා වැඩි කාලයක් අනියම් පදනම මත සේවය කරමින් සිටින බවත්;

(iii) මෙම අනියම් සේවකයන්ගේ තනතුරු ස්ථිර නොකර, පසුගිය මස සිට වෙනත් දිස්ත්‍රික්කවලට අයත් පුද්ගලයන් 06 දෙනෙකුට ස්ථිර පත්වීම් ලබාදී මෙම කාර්යාලයට අනුයුක්ත කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අවුරුදු 06කට වැඩි අනියම් සේවා කාලයක් සහිත සේවකයන්ගේ සේවය ස්ථිර කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1142/'16

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලේපත්තු, දකුණ කිරාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවන ලද දිනය කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද ගැසට් පත්‍රයේ පිටපතක් සභාගත කරන්නේද;

(iii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මඟින් ආවරණය වන සම්පූර්ණ භූමි ප්‍රමාණය කොපමණද;

(iv) එහි ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(v) එම ග්‍රාමනිලධාරී වසම්වල නිල අංකයන් හා නාමයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවීමේදී නිල වශයෙන් සීමා නිර්ණය කිරීමක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එකී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ඇති ග්‍රාම නිලධාරි වසම් අතරින් කිසියම් වසමක/වසම්වල පරිපාලන කටයුතු හෝ මෙහෙයවීම් වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදුකරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ග්‍රාම නිලධාරි වසම්වල නාමය, නිල අංකයන් ඇතුළු විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1166/'16

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාවලපිටිය මැතිවරණ බලප්‍රදේශයට අයත්, ඇත්ගාල ප්‍රදේශයේ, රාජ්‍ය දැව සංස්ථාවට අයත් සහකාර ප්‍රාදේශීය කළමනාකරණ කාර්යාලයක්, ඉරුම්හලක් හා දැව ගබඩාවක් පවත්වාගෙන යන බවත්;

(ii) නීත්‍යානුකූලව ලබා ගත් ඉඩමක, ඉතා ලාභදායී ලෙස මෙම ආයතනය පවත්වාගෙන යන බවත්; සේවකයන් 35 දෙනෙකු පමණ එහි සේවය කරන බවත් සහ එමඟින් ප්‍රදේශයට විශාල සේවාවක් සිදුවන බවත් පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) රාජ්‍ය දැව සංස්ථාවේ ඉහළ බලධාරියකුගේ බලපෑම මත එම ආයතනය කුණ්ඩසාලේ ප්‍රදේශයට රැගෙන යාමට කටයුතු කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1207/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) L.T.T.E. ත්‍රස්තවාදීන් විසින් 1983 වර්ෂයෙන් පසුව වව්නියාව දිස්ත්‍රික්කය තුළ ඝාතනය කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් ජන වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එලෙස ඝාතනයට ලක් වූ,

(i) එක් එක් දේශපාලන පක්ෂයන්හි නායකයන් හෝ සාමාජිකයන් සංඛ්‍යාව;

(ii) එක් එක් ආගම්වලට අයත් ආගමික නායකයන් හෝ ආගමික ජන කොටස් සංඛ්‍යාව;

(iii) රාජ්‍ය නිලධාරින් සංඛ්‍යාව;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත (අ) සහ (ආ) විමසා ඇති කරුණු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1279/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තමාගේ පදිංචිය සඳහා හෝ වගාවන් සඳහා හෝ ව්‍යාපාරික කටයුතු සඳහා හෝ ප්‍රවේණිගත ඉඩම් නොමැති ජනතාව රජයට අයත් ඉඩම් තම පරිහරණය පිණිස අනවසරයෙන් උපයෝගී කර ගන්නා බවත්;

(ii) කාලයාගේ ඇවෑමෙන් එසේ අනවසරයෙන් භුක්ති විඳිනු ලබන ඉඩම්, රජයේ අයිතියෙන් බැහැර කොට, නියමානුකූලව පවරාදීමේ පිළිවෙතක් සෑම රජයක් විසින්ම පවත්වාගෙන ආ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, වර්ෂ 2013 සිට මේ දක්වා මාතර දිස්ත්‍රික්කය තුළ බෙදා දී ඇති ඔප්පු, දීමනාපත්‍ර, හිමිකම්පත්‍ර හෝ බලපත්‍ර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත (i) හි සඳහන් සංඛ්‍යාව, මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මාතර දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම් අනවසරයෙන් භුක්ති විඳින එහෙත්, කිසිදු නීත්‍යානුකූල ලේඛනයක් අහිමි පුද්ගලයන් සංඛ්‍යාව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත (iii) හි සඳහන් පුද්ගලයන් වෙත දීමනා පත්‍රයක් හෝ අවම වශයෙන් බලපත්‍රයක් හෝ ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1319/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය දිනවල ඇතිවූ ජල ගැලීම්/නාය යාම් ආදී විපත් හේතුවෙන් විපතට පත්වූ පවුල් සඳහා මෙතෙක් එක් පවුලකට ලැබී ඇත්තේ රු. 10,000/- පමණක් බවත්;

(ii) එම විපත් නිසා හානියට පත්වූ දේපළ හා නිවාස සඳහා රජය ලබාදීමට පොරොන්දු වූ සහන එනම්, බඩු භාණ්ඩ සඳහා මුදල් සහ නිවාස ඉදිකර ගැනීම සඳහා විකල්ප ඉඩම් විපතට පත් වැසියන්ට මේ වනතෙක් ලැබී නොමැති බවත්;

(iii) එමෙන්ම, විපතට පත් රජයේ සේවකයන්ට මාස තුනක වැටුප්, පොලී රහිත ණය මුදලක් වශයෙන් ලබාදෙන බව පැවසුවද, එම ණය මුදල් මේ දක්වා ඔවුන්ට ලැබී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (iii) හි සඳහන් ණය මුදල රජයේ සේවකයන්ට ලබා දෙන්නේද; එසේ නම්, එම මුදල ලබා දෙන දිනය කවරේද;

(ii) විපතට පත්වූ පවුල් සඳහා ලබාදිය යුතු ඉතිරි මුදල් හා නිවාස ඉදිකර ගැනීම සඳහා ඉඩම් හා ආධාර ලබාදෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1340/’16

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, නෙරියම්මඩුව ප්‍රදේශයේ, 6 කණුව, පඩෙක්කාඩු, උන්නිච්චිය ප්‍රදේශයේ පිහිටි අක්කර 30ක වපසරියෙන් යුතු කුඹුරු ඉඩම 99 අවුරුදු බදු ක්‍රමය යටතේ රජය විසින් 1956.09.30 වැනි දින එවකට මඩකලපුවේ පන්සල පාර, අංක 34 යන ස්ථානයේ පදිංචිව සිටි ධර්මදාස තෙන්නහේවා මහතාට ලබාදී තිබූ බවත්;

(ii) ත්‍රස්තවාදී යුද්ධය හේතුවෙන් වර්ෂ 1987 දී පමණ ධර්මදාස තෙන්නහේවා මහතාට සහ පවුලේ සාමාජිකයන්ට එම ප්‍රදේශයෙන් ඉවත්වීමට සිදු වූ බවත්;

(iii) ඉහත කී කුඹුරු ඉඩමට අදාළව, 99 අවුරුදු බද්ද තවදුරටත් වලංගුව පවතින බවත්;

(iv) එම කුඹුරු ඉඩම දැනට මඩකලපුව, ලේක් රෝඩ් 2, අංක 66 දරන නිවසේ පදිංචි කන්දයියා යෝගවෙල් නමැති අය විසින් නීති විරෝධීව සහ බලහත්කාරයෙන් භුක්ති විඳින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත කී කුඹුරු ඉඩම නීති විරෝධීව භුක්ති විඳින තැනැත්තා නෙරපා දමා නීත්‍යානුකූලව එකී ඉඩමේ භුක්තිය දැරීමට අයිතිය ඇති, මේ වනවිට මියගොස් සිටින ධර්මදාස තෙන්නහේවා මහතාගේ උරුමකරුවන් වෙත එහි සන්තකය ලබා දීමට පියවර ගන්නේද;

(ii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1341/’16

ගරු හේෂාන් විතානගේ මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇඹිලිපිටිය-මොරකැටිය ප්‍රධාන මාර්ගය විශාල පිරිසක් දෛනිකව භාවිතා කරනු ලබන මාර්ගයක් බවත්;

(ii) එම මාර්ගයෙහි කොටසක් මේ වනතුරු කිසිදු ප්‍රතිසංස්කරණයකට ලක් කර නොමැති බවත්;

(iii) එබැවින්, එම මාර්ගය දෛනිකව පරිහරණය කරන විශාල පිරිසක් නිරතුරුවම පීඩාවට පත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම මාර්ගය සංවර්ධනය කිරීමට මුදල් වෙන් කර තිබේද;

(ii) එසේ නම්, එම මුදල කොපමණද;

(iii) එහි වැඩ ආරම්භ කිරීමට නියමිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2017 පෙබරවාරි මස 23 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

680/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂය තුළ ශ්‍රී ලංකාවට ආනයනය කළ සුදුරු හා මාදුරු ප්‍රමාණය කොපමණද;

(ii) ශ්‍රී ලංකාවට සුදුරු හා මාදුරු ආනයනය කරන ප්‍රධාන රටවල් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ සුදුරු හා මාදුරු වගා කරන්නේද;

(ii) එසේ නම්, එය ශ්‍රී ලංකාවේ අවශ්‍යතාවයෙන් කොපමණ ප්‍රතිශතයක්ද;

(iii) සුදුරු හා මාදුරු වගා නොකරන්නේ නම්, ඒ මන්ද;

(iv) ශ්‍රී ලංකාව තුළ සුදුරු හා මාදුරු වගාව ව්‍යාප්ත කිරීමට රජය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

922/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාතේ ක්ෂේත්‍ර නිලධාරින්ට මුදල් තැන්පත් කළ පසු නිකුත් කරන බවට පොරොන්දු වූ යතුරුපැදි ලබාදීමට යැයි පවසමින් 2015.11.14 සහ 2015.11.21 දින දෙකේම කැඳවීම් කළ බවත්;

(ii) එලෙස කැඳවීම් කළද, යතුරුපැදි ලබා නොදුන් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වයඹ පළාතේ ක්ෂේත්‍ර නිලධාරින්ට යතුරුපැදි ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

963/'16

ගරු බිමල් රත්නායක මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ දැනට ක්‍රියාත්මක පීඨ සංඛ්‍යාව කොපමණද;

(ii) එහි ක්‍රියාත්මක දෙපාර්තමේන්තු සංඛ්‍යාව කොපමණද;

(iii) එක් එක් පීඨවල හා දෙපාර්තමේන්තුවල සිටිය යුතු ස්ථිර ආචාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ස්ථිර ආචාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තිබේද;

(v) එසේ නම්, පුරප්පාඩු සංඛ්‍යාව, එක් එක් පීඨය සහ දෙපාර්තමේන්තුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

992/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරි, සම්පත් වේරගොඩ මහතා, ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයේ විදුහල්පති ලෙස පත් කර තිබේද;

(ii) ඔහු මොරටුව, වේල්ස් කුමර විද්‍යාලයේ විදුහල්පති ලෙස කටයුතු කළ සමයේ දී මුදල් වංචාවක් සිදු කිරීම සම්බන්ධයෙන් පවත්වනු ලැබූ විමර්ශන කටයුතු අවසන් වූ දිනය කවරේද;

(iii) එසේ නම්, එම විමර්ශනයේ නිගමන සහ නිර්දේශ කවරේද;

(iv) ඔහුට එරෙහිව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සිදු කරන විමර්ශනය අවසන් වී තිබේද;

(v) එසේ නම්, එහි නිගමන සහ නිර්දේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1038/'16

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2014ට පෙර කුරුඳු, ගම්මිරිස්, පුවක්, කරාබුනැටි, බුලත් සහ කොකෝවා යන භෝගවල අපනයනයට සාපේක්ෂව, වර්ෂ 2015 හා 2016 තුළ අපනයනය වැඩි වී තිබේද;

(ii) එසේ නම්, ඉහත එක් එක් භෝගයෙහි අපනයනය වැඩි වී ඇති ප්‍රතිශතය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නව වගා වැඩසටහන යටතේ මෙම වර්ෂ තුළ වගා කටයුතු වැඩි කර ඇති හෙක්ටයාර් ප්‍රමාණය කොපමණද;

(ii) ස්ථාපිත කර ඇති සැකසුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) සිදු කර ඇති යන්ත්‍ර උපකරණ බෙදා දීම් සංඛ්‍යාව කොපමණද;

(iv) ආරම්භ කර ඇති කාබනික ගම්මාන හා කුළුබඩු උද්‍යාන සංඛ්‍යාව කොපමණද;

(v) ඉහත කටයුතු ක්‍රියාත්මක වී නොමැති නම්, 2016 අයවැයෙන් වෙන් කරන ලද රුපියල් මිලියන 500 ක මුදල භාවිතා කර ඇති කාරණය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ගම්පහ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරන ලද සුළු අපනයන භෝග ප්‍රවර්ධන වැඩසටහන් කවරේද;

(ii) ඒ හේතුවෙන් ඵලදාව වැඩි වී ඇති ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1143/'16

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලේපත්තු, උතුරු වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවන ලද දිනය කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද ගැසට් පත්‍රයේ පිටපතක් සභාගත කරන්නේද;

(iii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මඟින් ආවරණය වන සම්පූර්ණ භූමි ප්‍රමාණය කොපමණද;

(iv) එහි ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(v) එම ග්‍රාම නිලධාරි වසම්වල නිල අංක හා නාමයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවීමේදී නිල වශයෙන් සීමා නිර්ණය කිරීමක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එකී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ඇති ග්‍රාම නිලධාරි වසම් අතරින් කිසියම් වසමක/වසම්වල පරිපාලන කටයුතු හෝ මෙහෙයවීම් වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදුකරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ග්‍රාම නිලධාරි වසම්වල නාමය, නිල අංක ඇතුළු විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1157/'16

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාත් පරිසර අධිකාරිය පිහිටුවන ලද දිනය කවරේද;

(ii) මේ දක්වා වයඹ පළාත් පරිසර අධිකාරිය විසින් අනුමත කරන ලද සංවර්ධන ව්‍යාපෘති කවරේද;

(iii) ආරම්භක වර්ෂයේ සිට අද දක්වා එහි සේවයේ නියුතු ප්‍රධාන නිලධාරින් හා අනෙකුත් නිලධාරින්ගේ තනතුරු කවරේද;

(iv) ප්‍රදේශයේ විවිධ පාරිසරික සංවිධාන මෙම පරිසර අධිකාරියේ කටයුතුවලට එරෙහිව ක්‍රියාකරන බව දන්නේද;

(v) එසේ නම්, වයඹ පළාත් පරිසර අධිකාරියේ කටයුතු පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදුකර අදාළ නිලධාරින්ට එරෙහිව කටයුතු කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1208/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) L.T.T.E. ත්‍රස්තවාදීන් විසින් 1983 වර්ෂයෙන් පසුව අම්පාර දිස්ත්‍රික්කය තුළ ඝාතනය කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් ජන වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එලෙස ඝාතනයට ලක් වූ,

(i) එක් එක් දේශපාලන පක්ෂයන්හි නායකයන් හෝ සාමාජිකයන් සංඛ්‍යාව;

(ii) එක් එක් ආගම්වලට අයත් ආගමික නායකයන් හෝ ආගමික ජන කොටස් සංඛ්‍යාව;

(iii) රාජ්‍ය නිලධාරින් සංඛ්‍යාව;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත (අ) සහ (ආ) විමසා ඇති කරුණු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1281/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත්, පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ, ක්ෂේත්‍ර කාර්යාලයක්, මාතර කැකණදුර, ගොවිජන කේන්ද්‍රයේ ස්ථාපිත කර තිබූ බවත්;

(ii) 2016.10.12 දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඉහත කී ක්ෂේත්‍ර කාර්යාලය වසා දමා ඇති බවත්;

(iii) ඊට සමාන්තරව, ගාල්ල ක්ෂේත්‍ර කාර්යාලයද වසා දමා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පසු අස්වනු තාක්ෂණය වඩාත් ප්‍රචලිත කළ යුතු තත්ත්වයක තිබියදී, පවතින යටිතල පහසුකම්ද මේ ආකාරයට කප්පාදුවට ලක් කිරීමෙන් ගොවි ජනතාව අපහසුවට පත් වන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, දැනට වසා දමා ඇති ක්ෂේත්‍ර කාර්යාල වහාම විවෘතකර ගොවි ජනතාවට අවශ්‍ය සහාය ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1342/'16

ගරු හේෂාන් විතානගේ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇඹිලිපිටිය ජාතික කඩදාසි කම්හල මේ වනවිට වසා දමා ඇති බවත්;

(ii) පසුගිය පාලන කාලය තුළ එම ආයතනය සතු සම්පත් සහ දේපළ විවිධ පුද්ගලයන් විසින් සොරා ගෙන ගොස් ඇති බවත්;

(iii) එයින් එම ආයතනය සම්පූර්ණයෙන්ම විනාශ වී ගොස් ඇති බවත්;

(iv) එහි රැකියාවේ නියුතු වූ සහ ඒ තුළින් වක්‍ර ලෙස ආදායම් ඉපයූ විශාල පිරිසක් මේ හේතුවෙන් ආර්ථික හා මානසික පීඩාවන්ට ලක්වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ආයතනය විනාශ වීම පිළිබඳ විධිමත් විමර්ශනයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එමඟින් අනාවරණය කර ගත් තොරතුරු කවරේද;

(iii) එම තොරතුරු මත හඳුනාගත් සැකකරුවන් සඳහා නීතිය ක්‍රියාත්මක කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1347/'16

ගරු ලකී ජයවර්ධන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "ළඟම පාසල - හොඳම පාසල" වැඩසටහන සඳහා තෝරාගෙන ඇති උඩුනුවර මැතිවරණ කොට්ඨාසයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත (i) හි සඳහන් පාසල් කවරේද;

(iii) මේ වනවිට එම පාසල් අතරින් නව ගොඩනැගිලි ඉදිකිරීමට යෝජිතව ඇති පාසල් කවරේද;

(iv) එම පාසල්වල ඉදිකිරීමට යෝජිත ගොඩනැගිලි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) "ළඟම පාසල - හොඳම පාසල" වැඩසටහන යටතේ තෝරා ගත් පාසල් අතරින් ඉඩකඩ අවම තත්ත්වයේ පවතින පාසල් සඳහා ගොඩනැගිලි ඉදිකිරීමට යෝජනා වී නොමැති බව දන්නේද;

(ii) මෙම වැඩසටහන යටතේ ගොඩනැගිලි පහසුකම් ඉතා අත්‍යවශ්‍ය පාසල් සඳහා ගොඩනැගිලි ලබාදීමට කටයුතු නොකර ඇත්තේ මන්ද;

(iii) එම පාසල් සඳහාද ඉතා ඉක්මණින් ගොඩනැගිලි පහසුකම් ලබාදීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1349/'16

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පාසල් දරුවන් සාමාන්‍යයෙන් වෘත්තීය පුහුණුවීම් සඳහා යොමුවීමට අධෛර්යමත් වන බවත්;

(ii) වර්තමානයේ ශ්‍රී ලංකාවේ ශ්‍රමික වෙළඳපොල ඉල්ලුම සපුරාලීමේදී තරුණ ප්‍රජාව සතු නිපුණතාවයන්ගේ නොගැලපීමක් පවතින බවත්;

(iii) දරුවන් විවිධ කුසලතාවයන් සඳහා පුහුණු කර, නව වෘත්තීය මාර්ගයන් කරා යොමු කිරීමේ දැඩි අවශ්‍යතාවයක් පවතින බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ප්‍රාථමික මට්ටමේ සිට තෘතීයික මට්ටම දක්වා පාසල් දරුවන්ගේ වෘත්තීය කුසලතා වර්ධනය කිරීමට පිටිවහලක් ලෙස, අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගයද ඇතිව පාසල් විෂය මාලාවෙහි වෙනසක් කිරීමට අමාත්‍යාංශය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

833/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දෙමළ කතා කරන ජනතාවට සිංහල භාෂාව ඉගැන්වීමටත්, සිංහල කතා කරන ජනතාවට දෙමළ භාෂාව ඉගැන්වීමටත් ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iii) පාසල් හැර ගිය රැකියා විරහිත පිරිසට, රජයේ සේවකයන්ට හා පෞද්ගලික අංශයේ සේවකයන්ට දෙමළ හා සිංහල භාෂාව ඉගැන්වීමට පියවර ගෙන තිබේද;

(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ඉගැන්වීමේ කාර්යයන් සඳහා ප්‍රමාණවත් ගුරුවරුන් සංඛ්‍යාවක් සිටින්නේද;

(ii) එසේ නම්, එම ගුරුවරුන් තෝරා ගැනීමේ ක්‍රමවේදය කවරේද;

(iii) නොඑසේ නම්, ගුරුවරුන් බඳවා ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සිංහල හා දෙමළ භාෂා ඉගැන්වීම සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(ii) එසේ නම්, එම මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

964/'16

ගරු බිමල් රත්නායක මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ දැනට ක්‍රියාත්මක පීඨ සංඛ්‍යාව කොපමණද;

(ii) එහි ක්‍රියාත්මක දෙපාර්තමේන්තු සංඛ්‍යාව කොපමණද;

(iii) එක් එක් පීඨවල හා දෙපාර්තමේන්තුවල සිටිය යුතු ස්ථිර ආචාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ස්ථිර ආචාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තිබේද;

(v) එසේ නම්, පුරප්පාඩු සංඛ්‍යාව, එක් එක් පීඨය සහ දෙපාර්තමේන්තුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1144/'16

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලේපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවන ලද දිනය කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද ගැසට් පත්‍රයේ පිටපතක් සභාගත කරන්නේද;

(iii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මඟින් ආවරණය වන සම්පූර්ණ භූමි ප්‍රමාණය කොපමණද;

(iv) එහි ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(v) එම ග්‍රාම නිලධාරී වසම්වල නිල අංක හා නාමයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවීමේදී නිල වශයෙන් සීමා නිර්ණය කිරීමක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එකී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ඇති ග්‍රාම නිලධාරි වසම් අතරින් කිසියම් වසමක/වසම්වල පරිපාලන කටයුතු හෝ මෙහෙයවීම් වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදුකරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ග්‍රාම නිලධාරි වසම්වල නාමය, නිල අංක ඇතුළු විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 මාර්තු මස 07 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

834/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගංජා, අබින්, මත්පෙති, ඖෂධ සිරප්, මදනමෝදක හා ඒ හා සමාන මත්ද්‍රව්‍ය සමාජය තුළ සීඝ්‍රයෙන් ව්‍යාප්තවී ඇති බවත්;

(ii) මෙම මත්ද්‍රව්‍ය වෙළඳාම පාසල් තුළද ව්‍යාප්තවී ඇති බවත්;

(iii) පාසල් සිසුන්ද මේ සඳහා ඇබ්බැහිවීමේ ප්‍රවණතාවක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උක්ත මත්ද්‍රව්‍යයන්ට අමතරව, පාසල් ආශ්‍රිතව භාවිතාවන බවට වාර්තා වී ඇති වෙනත් මත්ද්‍රව්‍ය වර්ග කවරේද;

(ii) 2014 හා 2015 යන වර්ෂයන්හිදී පාසල් ආශ්‍රිතව මත්ද්‍රව්‍ය වෙළඳාම් කළ හා ඊට සම්බන්ධ පාසල් සිසුන් අත්අඩංගුවට ගැනීම් සිදුකර තිබේද;

(iii) එසේ නම්, එම සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම සිසුන්ට එරෙහිව ගත් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පාසල් තුළට මත්ද්‍රව්‍ය ව්‍යාප්තවීම වැළැක්වීමට ගෙන ඇති වෙනත් ක්‍රියාමාර්ග කවරේද;

(ii) ඒ සම්බන්ධව පසු විපරම් කිරීමක් සිදුකරන්නේද;

(iii) එසේ නම්, ඒවා කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

929/'16

ගරු බිමල් රත්නායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල සඳහා පත්වීම් ලැබූ රාජ්‍ය තාන්ත්‍රික නිලධාරින්ට සේවා සහකාර තනතුර සඳහා ශ්‍රී ලංකාවෙන් පුද්ගලයන් රැගෙන යා හැකි බව දන්නේද;

(ii) 2005.01.01 සිට 2015.01.01 දක්වා කාලය තුළ තානාපති කාර්යාල සඳහා පත් කළ නිලධාරින් හා ඔවුන් කැටුව ගිය සේවා සහකාරවරයන්ගේ නම්, ගුවන් ගමන් බලපත්‍ර අංක සහ ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අදාළ රාජකාරි අවසන් වූ පසු නිලධාරින් හා සේවා සහකාරවරයන් ශ්‍රී ලංකාවට පැමිණි දින සහ එක් එක් සේවා සහකාරවරයාගේ ගුවන් ගමන් බලපත් අවලංගු වන දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) නිලධාරින් ශ්‍රී ලංකාවට පැමිණීමේදී ඔවුන් සමඟ නොපැමිණි සේවා සහකාරවරයන්ගේ නම් කවරේද;

(v) ශ්‍රී ලංකාවට නොපැමිණි සේවා සහකාරවරයන් සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශය ගත් පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

993/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් "ද රේඩියෝ සොසයිටි ඔෆ් ශ්‍රී ලංකා" හෙවත් ශ්‍රී ලංකා රේඩියෝ සමාජය, ආධුනික ගුවන් විදුලි ක්‍රියාකරුවන්ගේ ජාතික ආයතනය ලෙස පිළිගෙන තිබේද;

(ii) එසේ නම්, එය පිළිගත් දිනය කවරේද;

(iii) එසේ පිළිගැනීමට බලපෑ පදනම කවරේද;

(iv) එසේ පිළිගත් බවට කිසියම් ලියවිල්ලක් නිකුත් කර තිබේද;

(v) එසේ නම්, එම ලියවිල්ල සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1014/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා කුලී පදනම මත අලුතින් ගොඩනැගිල්ලක් ලබා ගෙන තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) ඒ සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, ටෙන්ඩරය සඳහා ඉදිරිපත් වූ පුද්ගලයන් සහ ඔවුන් ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) කුලී පදනම මත ලබාගත් ගොඩනැගිල්ල සඳහා රජයේ තක්සේරුව; අයිතිකරුගේ නම හා ලිපිනය; මාසික කුලිය සහ ගෙවූ අත්තිකාරම් මුදල කවරේද;

(vi) එම ගොඩනැගිල්ල සඳහා අයිතිකරු සමඟ අත්සන් කළ බදු ගිවිසුම සභාගත කරන්නේද;

(vii) කෘෂිකර්ම අමාත්‍යාංශය එම ගොඩනැගිල්ල වෙත ගෙන ගිය දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1145/'16

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලේපත්තු, වාලච්චේනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවන ලද දිනය කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද ගැසට් පත්‍රයේ පිටපතක් සභාගත කරන්නේද;

(iii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මඟින් ආවරණය වන සම්පූර්ණ භූමි ප්‍රමාණය කොපමණද;

(iv) එහි ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(v) එම ග්‍රාම නිලධාරි වසම්වල නිල අංක හා නාමයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවීමේදී නිල වශයෙන් සීමා නිර්ණය කිරීමක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එකී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ඇති ග්‍රාම නිලධාරි වසම් අතරින් කිසියම් වසමක/වසම්වල පරිපාලන කටයුතු හෝ මෙහෙයවීම් වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදුකරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ග්‍රාම නිලධාරි වසම්වල නාමය, නිල අංක ඇතුළු විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1209/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) L.T.T.E. ත්‍රස්තවාදීන් විසින් 1983 වර්ෂයෙන් පසුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ ඝාතනය කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් ජන වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එලෙස ඝාතනයට ලක් වූ,

(i) එක් එක් දේශපාලන පක්ෂයන්හි නායකයන් හෝ සාමාජිකයන් සංඛ්‍යාව;

(ii) එක් එක් ආගම්වලට අයත් ආගමික නායකයන් හෝ ආගමික ජන කොටස් සංඛ්‍යාව;

(iii) රාජ්‍ය නිලධාරින් සංඛ්‍යාව;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත (අ) සහ (ආ) විමසා ඇති කරුණු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1283/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ නිවාස නොමැති බවට හඳුනාගත් පවුල් සංඛ්‍යාව;

(ii) මාතර දිස්ත්‍රික්කයේ අර්ධ ස්ථිර හා ස්ථිර නිවාසවල ජීවත්වන පවුල් සංඛ්‍යාව;

එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2013 සිට 2016 දක්වා මාතර දිස්ත්‍රික්කයේ රජයේ ආධාර මත ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව;

(ii) වර්ෂ 2014 සිට 2016 දක්වා මාතර දිස්ත්‍රික්කයේ රජයේ නිවාස ණය මත ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව;

(iii) 2014, 2015 සහ 2016 වර්ෂවල මාතර දිස්ත්‍රික්කයේ නිවාස සංවර්ධන වැඩසටහන් සඳහා වෙන් කරන ලද මුදල;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1343/'16

ගරු හේෂාන් විතානගේ මහතා,— කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ළමා අපයෝජන හා ලිංගික අතවර හේතුවෙන් ලංකාවේ කාන්තාවන් සහ ළමුන් විශාල පිරිසක් අධිකරණය ඉදිරියට පැමිණෙන බවත්;

(ii) ඔවුන් විවෘත අධිකරණය තුළදීත්, ජනමාධ්‍ය හරහාත් වරින් වර වක්‍ර ලෙස නැවත එවැනි වූ අපයෝජනයට හා අතවරයට ගොදුරුවන බවත්;

(iii) එමඟින් ඔවුන් සමාජගත වීමේදී ප්‍රශ්න රාශියකට සහ විවිධ මානසික දුබලතාවයන්ට ලක් වී පීඩා විඳින බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) උක්ත හේතුව මත ලංකාවේ ළමා හා කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා විශේෂිත අධිකරණයක් පිහිටුවීමට යෝජනා කරන්නේද;

(ii) එවැනි තත්ත්වයකදී ඔවුන්ගේ අනාගත අභිවෘද්ධිය පිණිස ජනමාධ්‍ය වෙත මාධ්‍ය වාර්තාකරණයේ සීමාවන් පැනවීමට සැලසුමක් තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

844/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කතරගම, නල්ලූර්, මුන්නේශ්වරම්, තිරුකෝනේෂ්වරම් හා තිරුකේතීශ්වරම් යන ස්ථානයන්හි පිහිටි ශ්‍රී ලාංකීය හින්දු ආගමිකයන්ගේ ප්‍රධාන පූජනීය ස්ථාන වන්දනා කිරීමට විදේශිකයන්ද පැමිණෙන බවත්;

(ii) මෙම පූජනීය ස්ථානයන්හි විදේශීය සංචාරකයන්ට හා දේශීය සංචාරකයන්ට ප්‍රමාණවත් පහසුකම් නොමැති බවත්;

(iii) මෙම ස්ථාන සංවර්ධනය කිරීමෙන් රටේ ආර්ථිකයට ද විශාල දායකත්වයක් ලබාගත හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මෙම පූජනීය ස්ථාන සංවර්ධනයට රජය පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

965/'16

ගරු බිමල් රත්නායක මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර විශ්වවිද්‍යාලයේ දැනට ක්‍රියාත්මක පීඨ සංඛ්‍යාව කොපමණද;

(ii) එහි ක්‍රියාත්මක දෙපාර්තමේන්තු සංඛ්‍යාව කොපමණද;

(iii) එක් එක් පීඨවල හා දෙපාර්තමේන්තුවල සිටිය යුතු ස්ථිර ආචාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ස්ථිර ආචාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තිබේද;

(v) එසේ නම්, පුරප්පාඩු සංඛ්‍යාව, එක් එක් පීඨය සහ දෙපාර්තමේන්තුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1007/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කතරගම පූජා නගරයේ, ආරක්ෂක කලාපය තුළ පවතින 'ඔසු උයන' නමින් හඳුන්වන ඉඩමේ අක්කර තිහක පමණ කොටසක්, යුද හමුදාව ද යොදා ගෙන ඖෂධ පැලෑටි විනාශ කරමින් 2016 ජූලි මාසයේදී එළි පෙහෙළි කළ බවත්;

(ii) ඊට එරෙහිව මහ සංඝරත්නය සහ ප්‍රදේශයේ ජනතාව විරෝධය පළ කළ බවත්;

(iii) අංක එස්ඊඅයි/289/465 දරන 1990.01.30 දිනැති ලිපිය මඟින් ජනාධිපතිවරයා විසින් එකී ඉඩම ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට පවරා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් විනාශයට වගකිවයුත්තන් කවුරුන්ද;

(ii) ඔවුන්ට එරෙහිව ගෙන ඇති පියවර කවරේද;

(iii) එකී විනාශය සිදු කළේ එම ස්ථානයේ ඉන්දියාවේ තිරුපති දේවාලයේ ශාඛාවක් ඉදිකිරීමටද;

(iv) ඉහත (iii) හි සඳහන් ඉදිකිරීමට අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක අනුමැතිය හිමි වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1015/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බත්තරමුල්ල, ජයන්තිපුර ප්‍රදේශයේ කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් ඉඩමක් තිබේද;

(ii) එසේ නම්, එහි විශාලත්වය කොපමණද;

(iii) එම ඉඩමේ නිරවුල් භුක්තිය කෘෂිකර්ම අමාත්‍යාංශයට ලැබුණු දිනය කවරේද;

(iv) නිරවුල් භුක්තිය ලැබුණු අධිකරණ නියෝගය කවරේද;

(v) එම ඉඩම බලහත්කාරයෙන් අල්ලාගෙන සිටි පුද්ගලයන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(vi) කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් එම ඉඩම් මේ වනවිට භාවිතා කරනු ලබන කටයුත්ත කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1146/'16

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලේපත්තු බටහිර ඕඩ්ඩමාවඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවන ලද දිනය කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද ගැසට් පත්‍රයේ පිටපතක් සභාගත කරන්නේද;

(iii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මඟින් ආවරණය වන සම්පූර්ණ භූමි ප්‍රමාණය කොපමණද;

(iv) එහි ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(v) එම ග්‍රාමනිලධාරි වසම්වල නිල අංක හා නාමයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවීමේදී නිල වශයෙන් සීමා නිර්ණය කිරීමක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එකී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ඇති ග්‍රාම නිලධාරි වසම් අතරින් කිසියම් වසමක/වසම්වල පරිපාලන කටයුතු හෝ මෙහෙයවීම් වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදුකරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ග්‍රාම නිලධාරි වසම්වල නාමය, නිල අංක ඇතුළු විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1210/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) L.T.T.E. ත්‍රස්තවාදීන් විසින් 1983 වර්ෂයෙන් පසුව පුත්තලම දිස්ත්‍රික්කය තුළ ඝාතනය කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් ජන වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එලෙස ඝාතනයට ලක් වූ,

(i) එක් එක් දේශපාලන පක්ෂයන්හි නායකයන් හෝ සාමාජිකයන් සංඛ්‍යාව;

(ii) එක් එක් ආගම්වලට අයත් ආගමික නායකයන් හෝ ආගමික ජන කොටස් සංඛ්‍යාව;

(iii) රාජ්‍ය නිලධාරින් සංඛ්‍යාව;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත (අ) සහ (ආ) විමසා ඇති කරුණු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

846/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ දීර්ඝ කාලීනව පදිංචිව සිටින චීන සම්භවයක් සහිත පුද්ගලයන් ජීවත්වන කොළඹ හා ඒ අවට ග්‍රාම නිලධාරී වසම් කවරේද;

(ii) එම ප්‍රදේශවල දැනට ජීවත්වන චීන සම්භවයක් සහිත පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම පුද්ගලයන් ශ්‍රී ලංකාවේ වෙනත් ප්‍රදේශවල ජීවත්වන බවට වාර්තාවී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ජනතාවට අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා සෞඛ්‍ය යන මූලික අවශ්‍යතා ඉටුකර ගැනීමේ අයිතිය රජය විසින් තහවුරු කර තිබේද;

(ii) එසේ නම්, ඒ කෙසේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) උක්ත ජනතාවගේ සංස්කෘතික අනන්‍යතාවයන් හා පාරම්පරික උරුමයන් රැකගෙන ජීවත්වීම සඳහා රජය අනුග්‍රහයන් ලබා දී තිබේද;

(ii) එසේ නම්, ඒවා කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 මාර්තු මස 08 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

853/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු පළාතේ, යාපනය, කිලිනොච්චිය, මුලතිව්, මන්නාරම හා වවුනියාව යන දිස්ත්‍රික්කයන්හි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සතු විහාරස්ථාන කවරේද;

(ii) බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විහාරස්ථාන කවරේද;

(iii) මෙම විහාරස්ථාන නිදන් හොරුන්ගෙන් හා/හෝ සංවිධානාත්මක අපරාධකරුවන්ගෙන් ආරක්ෂා කර ගැනීමට පියවර ගෙන තිබේද;

(iv) එසේ නම්, එම පියවර කවරේද;

(v) වර්ෂ 2012 - 2014 කාලය තුළ මෙම විහාරස්ථානවලට උක්ත පුද්ගලයන්ගෙන් හානි සිදුවූ බවට වාර්තා වී තිබේද;

(vi) එසේ නම්, ඔවුන්ට එරෙහිව ගත් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම විහාරස්ථාන සංවර්ධනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

973/'16

ගරු බිමල් රත්නායක මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009.05.19 වැනි දිනට අනුරාධපුරය දිස්ත්‍රික්කයේ තිබූ මත්පැන් අලෙවිසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අලෙවිසැල් පිහිටි ස්ථානවල ලිපිනයන් කවරේද;

(iii) 2010, 2011, 2012, 2013, 2014 සහ 2015 යන වර්ෂයන්හි අලුතින් විවෘතකර ඇති මත්පැන් අලෙවිසැල් සංඛ්‍යාව, එක් එක් වර්ෂයට වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(v) මේ වනවිට අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ඒක පුද්ගල මත්පැන් පරිභෝජනය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1130/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෛද්‍ය ආඥාපනත යටතේ ලියාපදිංචි වී සිටින SAITM ආයතනයේ සිසුන් කණ්ඩායම් කවරේද;

(ii) වෛද්‍ය ආඥාපනත යටතේ ලියාපදිංචි වූ සිසුන්ට රජයේ රෝහල්වල සායනික පුහුණුව ලබාදීම සඳහා ශ්‍රී ලංකාවේ කවර හෝ අධිකරණයක් විසින් ඔබ අමාත්‍යාංශය වෙත නියෝග කර තිබේද;

(iii) එසේ නම්, එම අධිකරණ නියෝගය සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1147/'16

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කාත්තාන්කුඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවන ලද දිනය කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද ගැසට් පත්‍රයේ පිටපතක් සභාගත කරන්නේද;

(iii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මඟින් ආවරණය වන සම්පූර්ණ භූමි ප්‍රමාණය කොපමණද;

(iv) එහි ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(v) එම ග්‍රාම නිලධාරි වසම්වල නිල අංක හා නාමයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවීමේදී නිල වශයෙන් සීමා නිර්ණය කිරීමක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එකී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ඇති ග්‍රාම නිලධාරි වසම් අතරින් කිසියම් වසමක/වසම්වල පරිපාලන කටයුතු හෝ මෙහෙයවීම් වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදුකරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ග්‍රාම නිලධාරි වසම්වල නාමය, නිල අංක ඇතුළු විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1211/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) L.T.T.E. ත්‍රස්තවාදීන් විසින් 1983 වර්ෂයෙන් පසුව මන්නාරම දිස්ත්‍රික්කය තුළ ඝාතනය කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් ජන වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එලෙස ඝාතනයට ලක් වූ,

(i) එක් එක් දේශපාලන පක්ෂයන්හි නායකයන් හෝ සාමාජිකයන් සංඛ්‍යාව;

(ii) එක් එක් ආගම්වලට අයත් ආගමික නායකයන් හෝ ආගමික ජන කොටස් සංඛ්‍යාව;

(iii) රාජ්‍ය නිලධාරින් සංඛ්‍යාව;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත (අ) සහ (ආ) විමසා ඇති කරුණු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1285/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රමිතීන්ට අනුව, වෛද්‍යවරුන් හා ජනගහනය අතර පැවතිය යුතු අනුපාතය කවරේද;

(ii) ශ්‍රී ලංකාවේ එම අගය කවරක්ද;

(iii) මාතර දිස්ත්‍රික්කයේ සමස්ත ජනගහනය අනුව සිටිය යුතු වෛද්‍යවරු සංඛ්‍යාව කොපමණද;

(iv) දැනට සිටින වෛද්‍යවරු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මාතර දිස්ත්‍රික්කය තුළ සේවයේ යොදවා ඇති සෞඛ්‍ය සේවයට අදාළ මුළු නිලධාරින් හා සේවකයන් සංඛ්‍යාව, එක් එක් වෘත්තිය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

854/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිසාවේ, දෙනියාය අඩවියට අයත් පැවිනා වනාන්තරයට විදේශිකයන් විහාරහේන පාරෙන් රැගෙන ගොස් දොළ අසලින් වනාන්තරයට අනවසරයෙන් ඇතුල්වන බවත්;

(ii) මොවුන් සිංහරාජ වනාන්තර නැරඹීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විවෘත කර ඇති පිටදෙනිය ප්‍රවේශය භාවිතා නොකරන බවත්;

(iii) එසේ ඇතුල්වන්නේ සිංහරාජය ආශ්‍රිත මාතර දිස්ත්‍රික්කයේ පිහිටි තරු පන්තියේ හෝටල් හි නවාතැන් ගන්නා සංචාරකයන් බවත්;

(iv) මෙම මාර්ගය ඔස්සේ වනාන්තරයට ඇතුල්වීම මඟින් සිංහරාජයේ ජෛව විවිධත්වයට හානි සිදුවීම හා ජාන මංකොල්ලයට ඉඩ සැලසිය හැකි බවත්;

(v) මේ හරහා රජයට විශාල මූල්‍ය පාඩුවක් සිදුවන බවත්

එතුමා දන්නෙහිද?

(ආ) (i) සිංහරාජයට සංචාරකයන් ඇතුළත් කිරීමට විධිමත් වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මාතර දිස්ත්‍රික්කයේ, සිංහරාජය ආශ්‍රිතව පිහිටි තරු පන්තියේ හෝටල් වනාන්තරය තුළ මාර්ග සකසා ඇති බවට හෝ ඉදිකිරීම් සිදු කර ඇති බවට සොයා ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ආයතනයන්ට එරෙහිව ගත් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

974/'16

ගරු බිමල් රත්නායක මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009.05.19 වැනි දිනට මන්නාරම දිස්ත්‍රික්කයේ තිබූ මත්පැන් අලෙවිසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අලෙවිසැල් පිහිටි ස්ථානවල ලිපිනයන් කවරේද;

(iii) 2010, 2011, 2012, 2013, 2014 සහ 2015 යන වර්ෂයන්හි අලුතින් විවෘතකර ඇති මත්පැන් අලෙවිසැල් සංඛ්‍යාව, එක් එක් වර්ෂයට වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(v) මේ වනවිට මන්නාරම දිස්ත්‍රික්කය තුළ ඒක පුද්ගල මත්පැන් පරිභෝජනය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2017 මාර්තු මස 09 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

855/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, 181F කැටගෙවත්ත ග්‍රාම නිලධාරි වසමෙහි, ඉහළගම ග්‍රාමයෙහි පිහිටා තිබෙන පොල්ගහ වැව (ඉහළගම) නිසි ලෙස නඩත්තු නොකිරීම හේතුවෙන් විනාශ වීමේ අවදානමක් ඇති බවත්;

(ii) ඇතැම් සංවිධානාත්මක පිරිස් වැව ගොඩ කිරීමට හා වැවට අයත් රක්ෂිත ඉඩම් අත්කර ගැනීමට කටයුතු කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහළගම වැව ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2016 අයවැයෙන් මුදල් වෙන්කර තිබුණේද;

(iv) එසේ නම්, එම ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) නීතිවිරෝධී ලෙස වැව ගොඩ කිරීම හා වැවට අයත් ඉඩම් අත්කර ගැනීම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම නීතිවිරෝධී ක්‍රියාවන්ට දායකවූ පිරිසගේ නම් කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ගත් ක්‍රියාමාර්ග කවරේද;

(iv) වැවේ ඇතැම් ස්ථාන ගොඩකර කොහිල වගා කර ඇති ප්‍රදේශ නැවත අත්කර ගැනීමට කටයුතු කරන්නේද;

(v) එලෙස කොහිල වගා කළ අයට විරුද්ධව ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

975/'16

ගරු බිමල් රත්නායක මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009.05.19 වැනි දිනට මුලතිව් දිස්ත්‍රික්කයේ තිබූ මත්පැන් අලෙවිසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අලෙවිසැල් පිහිටි ස්ථානවල ලිපිනයන් කවරේද;

(iii) 2010, 2011, 2012, 2013, 2014 සහ 2015 යන වර්ෂයන්හි අලුතින් විවෘතකර ඇති මත්පැන් අලෙවිසැල් සංඛ්‍යාව, එක් එක් වර්ෂයට වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(v) මේ වනවිට මුලතිව් දිස්ත්‍රික්කය තුළ ඒක පුද්ගල මත්පැන් පරිභෝජනය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1148/'16

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල, කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු ඉඩමේ පිහිටි මොහිදීන්වත්ත නිවාස යෝජනා ක්‍රමයේ තිබෙන නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවෙස්වල දැනට පදිංචිකරුවන් ලෙස හඳුනාගෙන සිටින පුද්ගලයන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම නිවෙස්වල මුල් අයිතිකරුවන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම නිවාස යෝජනා ක්‍රමය සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත පවරාගනු ලැබූ ඉඩමේ ප්‍රමාණය කොපමණද;

(ii) ඉඩම පවරාගන්නා අවස්ථාවේදී ඉඩම් හිමියා/හිමියන් ලෙස හඳුනාගෙන සිටි පුද්ගලයා/ පුද්ගලයන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම ඉඩම රජයට පවරාගත් බවට සඳහන් ගැසට් පත්‍රයේ පිටපතක් සභාගත කරන්නේද;

(iv) ඉඩම් පවරා ගැනීම වෙනුවෙන් එවකට වන්දි ප්‍රදානය කළේද;

(v) එසේ නම්, එම වන්දි ප්‍රමාණය කොපමණද;

(vi) වන්දි ලබාගත් පුද්ගලයන්ගේ නම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1212/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) L.T.T.E. ත්‍රස්තවාදීන් විසින් 1983 වර්ෂයෙන් පසුව කිලිනොච්චි දිස්ත්‍රික්කය තුළ ඝාතනය කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් ජන වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එලෙස ඝාතනයට ලක් වූ,

(i) එක් එක් දේශපාලන පක්ෂයන්හි නායකයන් හෝ සාමාජිකයන් සංඛ්‍යාව;

(ii) එක් එක් ආගම්වලට අයත් ආගමික නායකයන් හෝ ආගමික ජන සංඛ්‍යාව;

(iii) රාජ්‍ය නිලධාරීන් සංඛ්‍යාව;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත (අ) සහ (ආ) විමසා ඇති කරුණු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

856/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස, ගොඩපිටිය ජාතික පාසලට 2016 වර්ෂය සඳහා 6 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේදී අක්‍රමිකතාවයක් සිදුවී ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් සිසුන් පිරිසකට අසාධාරණයක් සිදු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ගොඩපිටිය ජාතික පාසලට 2016 වර්ෂය සඳහා වෙනත් පාසල්වලින් 6 ශ්‍රේණියට ඇතුළත් කරගත් ශිෂ්‍යයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ශිෂ්‍යයන් ඇතුළත් කර ගත් ක්‍රමවේදය, එක් එක් ශිෂ්‍යයා අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) තෝරාගත් සිසුන් පිළිබඳ ලේඛනයක් විදුහල්පතිවරයා විසින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබේද;

(iv) එසේ නම්, එම ලේඛනයට අමාත්‍යාංශයේ නිර්දේශය ලබාදී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මේ පිළිබඳව පරීක්ෂණයක් සිදු කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) අසාධාරණයට ලක් වූ සිසුන් සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1172/’16

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි රාජ්‍ය ආයතන සතු ඉඩම් ප්‍රමාණය කවරේද;

(ii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පදිංචිකරුවන් විසින් රජයේ ඉඩම් ප්‍රදාන/ බලපත්‍ර මත ලබා ගැනීම සඳහා අයදුම් කර තිබේද;

(iii) එසේ නම්, එම ඉල්ලීම් ප්‍රමාණය කොපමණද;

(iv) එම ඉල්ලුම්කරුවන්ට මේ දක්වා ප්‍රදාන/බලපත්‍ර මත ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1213/’16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) L.T.T.E. ත්‍රස්තවාදීන් විසින් 1983 වර්ෂයෙන් පසුව මුලතිව් දිස්ත්‍රික්කය තුළ ඝාතනය කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් ජන වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එලෙස ඝාතනයට ලක් වූ,

(i) එක් එක් දේශපාලන පක්ෂයන්හි නායකයන් හෝ සාමාජිකයන් සංඛ්‍යාව;

(ii) එක් එක් ආගම්වලට අයත් ආගමික නායකයන් හෝ ආගමික ජන කොටස් සංඛ්‍යාව;

(iii) රාජ්‍ය නිලධාරීන් සංඛ්‍යාව;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත (අ) සහ (ආ) විමසා ඇති කරුණු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1465/'16

ගරු විමලවීර දිසානායක මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශ්‍රාමික ජනාධිපතිවරුන්ගේ ආරක්ෂාව සඳහා යොදවන පොලිස් නිලධාරින්ට ගමන් වියදම් හා මූලික වැටුපෙන් 1/3ක විශේෂ දීමනාවක් ගෙවනු ලබන්නේද;

(ii) එසේ නම්, විශ්‍රාමික ජනාධිපතිවරයකු වූ ගරු මහින්ද රාජපක්ෂ මහතාගේ ආරක්ෂක සේවයේ යෙදෙන පොලිස් නිලධාරින්ට එකී දීමනාව 2016 මැයි මස සිට ගෙවීම අත්හිටුවා ඇත්තේ මන්ද;

(iii) සමාන සේවයට සමාන හිමිකම් නොලැබෙන එම පොලිස් නිලධාරින්ට අදාළ දීමනා ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 මාර්තු මස 10 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

858/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වනාන්තර භූමි ප්‍රමාණය ඉහළ නැංවීමට රජය කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම වනාන්තර කවරේද;

(iii) ඉහළ නැංවීමට අපේක්ෂිත හෙක්ටයාර ප්‍රමාණය, එක් එක් වනාන්තරය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නව වන වගා ඇති කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ප්‍රදේශ තෝරාගෙන තිබේද;

(iii) එම ප්‍රදේශ කවරේද;

(iv) නව වන වගා ඇති කිරීමට අපේක්ෂිත හෙක්ටයාර් ප්‍රමාණය එක් එක් ප්‍රදේශය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1214/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) L.T.T.E. ත්‍රස්තවාදීන් විසින් 1983 වර්ෂයෙන් පසුව යාපනය දිස්ත්‍රික්කය තුළ ඝාතනය කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් ජන වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එලෙස ඝාතනයට ලක් වූ,

(i) එක් එක් දේශපාලන පක්ෂයන්හි නායකයන් හෝ සාමාජිකයන් සංඛ්‍යාව;

(ii) එක් එක් ආගම්වලට අයත් ආගමික නායකයන් හෝ ආගමික ජන කොටස් සංඛ්‍යාව;

(iii) රාජ්‍ය නිලධාරින් සංඛ්‍යාව;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) ඉහත (අ) සහ (ආ) විමසා ඇති කරුණු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

860/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා යුධ හමුදාවේ, 06 වන කාලතුවක්කු රෙජිමේන්තුවේ, අංක 65954 යටතේ සේවය කරන, දික් ඇල්ල ලේකම්ගේ වමිත් අංජුල කුමාර ලේකම්ගේ යන නිලධාරියා හමුදා විනය නීති කඩකර ඇති බවත්;

(ii) මොහු පිළිබඳ ක්‍රියාත්මක වූ පරීක්ෂණ නිසියාකාරව සිදු නොවූ බවත්;

(iii) මේ හේතුවෙන් අගතියට පත් ඔහුගේ බිරිඳ වන ශ්‍රීමාලි ලසන්තිකා නවරත්න යන අයට අසාධාරණයක් සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උක්ත නිලධාරියා පිළිබඳ පරීක්ෂණයක් සිදු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවදා සිටද;

(iii) ශ්‍රීමාලි ලසන්තිකා නවරත්න යන අයට සිදුවී ඇති අසාධාරණය සම්බන්ධව ඇයට සහනයක් ලබාදීමට යුධ හමුදාව මැදිහත් වන්නේද;

(iv) එසේ නම්, ඒ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1235/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට පැවැති මුළු මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායින් තාර දමා තිබූ මාර්ග සංඛ්‍යාව සහ කි.මී. ප්‍රමාණය කොපමණද;

(iii) වර්ෂ 1983 සිට යුද්ධය නිම වන තුරු එම දිස්ත්‍රික්කය තුළ මාර්ග ඉදිකිරීම සඳහා පැවති රජයන් විසින් වියදම් කරන ලද මුදල, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යුද්ධය නිම වීමෙන් පසු මෙම දිස්ත්‍රික්කය තුළ මාර්ග ඉදි කිරීම වෙනුවෙන් එක් එක් වර්ෂය තුළ වෙන් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඒ පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?